# කාර්ය සාධන වාර්තාව
# 2015 වර්ෂය

## තක්සේරු දෙපාර්තමේන්තුව

මුදල් අමාත්‍යාංශය

# පටුන

## I කොටස - කළමනාකරණ විශ්ලේෂණ

පෙරවදන------------------------------------------------- 3

හැඳින්වීම------------------------------------------------- 4

වාර්තාව පරිශීලනය--------------------------------------- 4

අප ගැන

ඉදිරි දැක්ම----------------------------------------------- 5

මෙහෙවර ප්‍රකාශය---------------------------------------- 5

මූලික වගකීම්--------------------------------------------- 5

අරමුණු -------------------------------------------------- 5

මූලික ක්‍රියාදාමයන්----------------------------------------

අභියෝග සහ කළමණාකරණ උපක්‍රම-------------------- 8

2015 වසරේ විශේෂ සිදුවීම්----------------------------------- 9

## II කොටස - කාර්යසාධනය

ප්‍රවර්ධන සටහන්

වෘත්තීය නිපුණතා ප්‍රවර්ධනය---------------------------- 10

තාක්ෂණික ප්‍රවර්ධනය----------------------------------- 14

කාර්යසාධන මිණුම්දඬු සහ වාර්තාකරණය---------------- 15

## III කොටස - මූල්‍යමය සාධනය සහ විශ්ලේෂණය

මූල්‍යසාධන මිණුම් දඬු සහ විශ්ලේෂණය----------- 26

## IV කොටස - අනුමත මානව සම්පත් සහ ශ්‍රම ශක්තිය

සේවක පිරිස් ගිණුම------------------------------------- 27

## V කොටස - දේපළවෙළෙඳ පොළ විග්‍රහය

දේපළ වෙළඳ පොළ විග්‍රහය" -------------------------------- 28

ආයතන ව්‍යුහව - 2015 ඇමුණුම - 01

# I කොටස- කළමනාකරණ විශ්ලේෂණ

## පෙරවදන

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මෙරට සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සුවිශේෂ දායකත්වයක් සපයන බව ප්‍රකට කරුණකි.මෙම දෙපාර්තමේන්තුව මගින් සපයන සේවාවන්; පළාත් පාලන ආයතන්ට අයත් දේපල සඳහා වරිපනම් අංක සැපයීම, රජයේ නිල නිවාස සඳහා කුළී වටිනාකම තක්සේරු කිරීම වැනි කාර්යයන්ගේ සිට රාජ්‍ය ව්‍යවසායන් සඳහා ව්‍යාපාර තක්සේරුකරණය වැනි පුළුල් පරාසයක විහිදෙන්නකි.

2015 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව තුළ අප දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම, මෙහෙවර සහ අරමුණු හා වගකීම් මනාව පිළිබිඹු වේ. එය, අපගේ සහ රජයේ සංවර්ධන ක්‍රියාදාමයන්හි ඉලක්කයක් ළඟාකර ගැනීම සඳහා අප දැරූ සාමූහික ප්‍රයත්නය සාධනය කර ඇති බවට සාක්ෂි දරයි.

ගරු මුදල් අමාත්‍ය, ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන්ගේ සහ ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ මඟ පෙන්වීම සහ සහයෝගය කෘතඥතා පූර්වකව සටහන් කරමි. අපගේ අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා, නියෝජ්‍ය ලේකම්තුමා සහ මුදල් අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය දෙන ලද සහයෝගය අගය කොට සලකමි.

අපගේ සේවාදායකයින් සමඟ සහයෝගයෙන් ඉලක්කගත කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනීම සඳහා උපරිම සහය දැක්වූ තක්සේරු දෙපාර්තමේන්තුවේ සියලු ම කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරන අතර, ඉදිරියටද රටේ සංවර්ධන ක්‍රියාවලියේදී ඔබගේ සහභාගිත්වය අපේක්ෂා කරමි.

ඊ. දයාසේන
ප්‍රධාන තක්සේරුකරු
තක්සේරු දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

මෙම " පාලන හා කාර්යසාධන වාර්තාව" තක්සේරුකරණ හා මූල්‍ය පරිපාලන ක්‍රියාවලිය මුදුන්පත් කර ගැනීමට යොදාගත් උපක්‍රම, සැළසුම් උපායමාර්ග, මුදල් අමාත්‍යාංශයේ තක්සේරුකරණ හා මූල්‍ය පරිපාලන ක්‍රියාවලිය මුදුන්පත් කර ගැනීමට යොදාගත් උපක්‍රම, සැළසුම් උපායමාර්ග, මුදල් අමාත්‍යාංශය මගින් වූ අයවැය සම්පාදන හා අවසන් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් කරන ලද කාර්යභාරය හා සම්පත් පරිශීලනය ගෙනහැර දැක්වෙන ප්‍රයත්නයයි. 2015 වසර තුළ දෙපාර්තමේන්තුව මගින් ඉටුකළ කාර්යභාරය සවිස්තරාත්මකව සාකාච්ඡා කෙරෙන මෙම වාර්තාව පිළියෙළ කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසිවල අවශ්‍යතාවන්ට අනුව සහ ඊට ගැලපෙන පරිදි වේ.

## මෙම වාර්තාව පරිශීලනය කරන ආකාරය

මෙම වාර්තාවෙන් විස්තර වන්නේ 2015 වසරේ දෙපාර්තමේන්තු කාර්ය සාධන නිර්ණායකයන්, ප්‍රගතිය හා ඉටුකරනු ලැබූ කාර්යභාරය වන අතර, ප්‍රගතිය ඇගයීමේදී අත්කරගත් ප්‍රගතිය වාර්ෂික කාර්යසාධන සැලැස්මේ ඉලක්කගත කාර්යභාරය සමග සංසන්දනය කරමින් සාකච්ඡා කෙරේ.

## කළමනාකරණ විශ්ලේෂණ

මේ යටතේ අපගේ කාර්ය සාධනය පුළුල්ව සහ 2015 වසරේ සම්පත් පරිහරණය පිළිබඳව වූ විස්තර මෙන්ම , අරමුණු සාර්ථක කර ගැනීමෙහිලා ඉවහල් කරගත් උපක්‍රම, කළමනාකරණ අභියෝග හා අපගේ කාර්යසාධනයට බලපෑ බාහිර කරුණු අන්තර්ගත කර ඇත.

- **කාර්යසාධනය**

  මෙහිදී 2015 වසරේ කාර්ය සාධනය අපගේ දිගු කාලීන ඉලක්කගත අරමුණු සහ 2015 වසරේ ඉලක්කකර ගත් අරමුණු, ඒවා සාක්ෂාත් කර ගැනීමෙහිලා යොදාගත් උපාය මාර්ග, එය සපුරාගත් ආකාරය මෙන්ම සපුරා ගැනීමට නොහැකි වූ අරමුණු සහ ඊට හේතු පාදක වූ කරුණු ද විශ්ලේෂණය කරමින් සාකාච්ඡාවට භාජනය කර ඇත.

- **මූල්‍ය තොරතුරු**

  2015 වසරේ මූල්‍ය, ඒකාබද්ධ මූල්‍ය වාර්ථා, මූල්‍ය ප්‍රකාශන සහ ඊට අනුබද්ධ තොරතුරු සඳහා මෙම ශීර්ෂය යටතේ පරිශිලනය කරන්න.

- **අනුමත සේවක පිරිස**

  දෙපාර්තමේන්තුවේ මානව සම්පත් පිලිබඳ ලුහුඩු විශ්ලේෂණයක් සඳහා මෙම ශීර්ෂය යටතේ පරිශීලනය කරන්න.

- **දේපල වෙළඳපල විග්‍රහය**

  "ශ්‍රී ලංකාවේ දේපල වෙළඳපල" පිළිබඳ ප්‍රධාන තක්සේරුකරුගේ විග්‍රහය සඳහා මෙම ශිර්ෂය යටතේ පරිශීලනය කරන්න.

## අප ගැන

### ඉදිරි දැක්ම

"තත්‍ය දේපළ තක්සේරුකරණ සහ කළමනාකරණ විෂයයෙහිලා
ගෝලීය ප්‍රමිතීන් පදනම් වූ ප්‍රශස්ත වෘත්තීමය සේවාවන් තුළින්
සමාජ ආර්ථික ප්‍රවර්ධනය"

### මෙහෙවර ප්‍රකාශය

"කාර්යක්ෂම හා ඵලදායි කළමනාකරණ ව්‍යුහයක් තුළින්
තරඟකාරීව මෙන්ම පිරිවැය පිළිබඳ සවිඥාණකව
ශ්‍රී ලංකා රජයට පූර්ණ වෘත්තීමය තක්සේරු හා
දේපල කළමනාකරණ සේවාවන් සැපයීම"

### මූලික වගකීම්

"රාජ්‍ය හා අනුබද්ධ ආයතන උදෙසා තක්සේරු සේවාවන්
හා දේපල කළමනාකරණ උපදේශක සේවාවන්
තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සපයනු ලැබේ"

### අරමුණු

"මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු වනුයේ
සේවාදායකයින් වෙත හොඳම කාර්යය සාධන ප්‍රමිතීන්
මත පිහිටා සේවාවන් සැපයීමයි"

## මූලික ක්‍රියාදාමයින්

දේපළ කළමනාකරණ හා තක්සේරුකරණය සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇතුළුව රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන් ප්‍රධාන වශයෙන් පහත සඳහන් අයුරින් වර්ගීකරණය කළ හැකි ය.

(අ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පුද්ගලික දේපළ පොදු කටයුතු සඳහා අත්කර ගන්නා විට, එම පනත යටතේ ගෙවිය යුතු වන්දි සඳහා තක්සේරු වාර්තා පිළියෙළ කරනු ලබන අතර, හදිසි අත්කර ගැනිමක දී මෙම පනතේ 38 (අ) විධානය යටතේ තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම ද සිදු කරනු ලැබේ.

(ආ) ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ යථා කාලයේදී දේපළ අත්කර ගැනීමේ අරමුණින් මුදල් ප්‍රතිපාදනයන් වෙන්කර ගැනීම උදෙසා දේපළ ඇස්තමේන්තු කටයුතු ද කරනු ලැබේ.

(ඇ) පුද්ගලික ගිවිසුම් මත දේපල මිලදී ගැනීම සහ සන්තකය බැහැර කිරීම, ගිණුම් කටයුතු මෙන්ම බදු කාර්යයන් උදෙසා සහ වෙනත් විවිධ කාර්යයන් සඳහා චංචල හා නිශ්චල දේපල තක්සේරු කරනු ලබයි.

(ඈ) රජයේ හා රාජ්‍ය ආයතන වල දේපළ කුළියට දීම සහ පුද්ගලික දේපළ රජයට සහ රාජ්‍ය අනුබද්ධ ආයතනවල පරිහරණය සඳහා අවශ්‍ය වූ විට,ඒ සඳහා කුළී තක්සේරු සපයනු ලැබේ.

(ඉ) කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි දේපළ හැර දිවයිනේ වරිපනම් බදු අය කෙරෙන සියලුම පළාත් පාලන ආයතනයන්ට අයත් දේපළ, වරිපනම් බදු අයකිරීමේ කාර්යය උදෙසා තක්සේරු කරනු ලබන අතර, අතෘප්තිමත් පුද්ගලයින් විසින් වරිපනම් තක්සේරුවලට එරෙහිව ඉදිරිපත් කෙරෙන විරෝධතා පිලිබඳ නිශ්චය කිරීමේ දී වෘත්තීය සහය දැක්වීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

(ඊ) තක්සේරුකරණය හා තත්‍ය දේපළ කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක සේවාවන් සැපයීම හා එම අංශයන්හි දැනුම වැඩි දියුණු කිරිම උදෙසා අවශ්‍ය කටයුතු ද මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

(උ) විශේෂඥ සාක්ෂ්‍ය සැපයීම මගින් අධිකරණයට හා විවිධ වන්දි විනිශ්චය සභාවලට සහය වන අතර, දෙපාර්තමේන්තු නිලධාරීන්, ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින්, ගෙවල් කුලී පනත යටතේ ස්ථාපිත ගෙවල් කුලී මණ්ඩලවල ( කොළඹ මහ නගර සභා සීමා බල ප්‍රදේශය තුළ හැර, අනෙකුත් ගෙවල් කුලී මණ්ඩලවල ) රැස්වීම් වලට සීමා වේ.

(ඌ) රාජ්‍ය භාණ්ඩාගාරයේ ඉල්ලීම මත, රාජ්‍ය ව්‍යවසායන් සඳහා ව්‍යාපාර තක්සේරු කටයුතු සිදුකරනු ලැබේ.

(ඔ) කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි රජයේ දේපළවල වාර්ෂික වටිනාකම් ප්‍රධාන තක්සේරුගේ අනුමැතිය සහිතව කොළඹ මහ නගර සභාව විසින් තක්සේරු කරනු ලැබේ.

(ඕ) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල ගිණුම්කරණ අරමුණු කටයුතු සඳහා වත්කම් තක්සේරු කිරිම.

## අභියෝග හා කළමනාකරණ උපක්‍රම

යෝග්‍ය ක්‍රමවේදයන් අනුගමනය කිරීමතුලින් පූර්ව ක්‍රමවේදයන්හි පැවති දුර්වලතා අභිබවා සඵලතාවය වැඩිදියුණු කර ගැනීමේ මූලික පරමාර්ථය පෙරදැරිව සමස්ත දෙපාර්තමේන්තුවේ සියලු ම අංශ ආවරණය වන පරිදි, එනම් කළමනාකරණ හා ආයතන කටයුතු වෘත්තිය නිපුණතා මානව සම්පත් සංවර්ධනය හා උසස් වෘත්තිය අවශ්‍යතා පරිපූර්ණ කළ හැකි පරිදි සකසන ලද කාර්යක්ෂම හා ඵලදායි ක්‍රමවේදයක් තුලින් පෙර වසරට වඩා ඵලදායි ආකාරයෙන් දෙපාර්තමේන්තුවේ සියලු කටයුතු මෙහෙයවීම විශේෂ සැලකිය හැකි ය.

උපක්‍රමික කළමනාකරණය යටතේ එන "ශදුඅත" (ශක්තිය, දුර්වලතා, අවස්ථා සහ තර්ජන) විශ්ලේෂණය මගින් දෙපාර්තමේන්තුවේ කාර්යය කිරීමේදි ප්‍රධාන අරමුණු ඉටු කරගැනීමෙහිලා ආයතනය සතු ශක්තීන්, දුර්වලතා බාහිරින් ඇති අවස්ථා තර්ජන පිළිබඳ විග්‍රහ කොට වඩා සාර්ථක සංවර්ධන සැලැස්මක් කරා ළඟා වීමට දෙපාර්තමේන්තුවේ සියලු කටයුතු මෙහෙයවීම මෙහිලා විශේෂ කොට දැක්විය හැකිය. බලය සැලකීමේදී කටයුතුවල නියැලෙන සියලු නිලධාරීන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරුකරණය පිළිබඳ විශේෂ උපාධිලත් පිරිසක් වීම විශේෂ සම්පතක් ලෙස දැක්විය හැකි ය.

## 2015 වසරේ විශේෂ සිදුවීම.

**පොදු රාජ්‍ය මණ්ඩලීය තක්සේරු ආයතන ප්‍රධානීන්ගේ සමුළුව**
**CHOVA 2015**

**2015 නොවැම්බර් 19 – 21 දිනයන්හිදී ශ්‍රී ලංකාවේ කොළඹදී පැවැත්වීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව සත්කාරකත්වය දක්වන ලදි.**

**CHOVA** 2015, **සම්මන්ත්‍රණය රජය විසින් අනුග්‍රහය දක්වන රාජ්‍ය අංශයේ සම්මන්ත්‍රණයක් වන අතර , අත්කර ගත් ඉඩම් සඳහා වන්දි මුදල් තක්සේරු කිරීම , වරිපනම් බදු, දේපල බදු, සම්පත් වටිනාකම්, රජයේ අභිප්‍රායන් සඳහා තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. පළමු සම්මන්ත්‍රණය 1977 වර්ෂයේ මලයාසියාවේ ක්වාලාලාම්පූර් නගරයේදී පවත්වන ලද අතර ඉන් පසු කැනඩාව, නවසීලන්තය, වැන්කූවර්, ජැමෙයිකාව, උතුරු අයර්ලන්තය, ඔස්ට්‍රේලියාව, සහ කැනඩාවේ පවත්වන ලදි.**

**පොදු රාජ්‍ය මණ්ඩලීය තක්සේරු ආයතන ප්‍රධානීන්ගේ සම්ළුව, ඉඩම් භාවිතය , හිමිකම, සංවර්ධනය සහ අවසානයේ එහි තක්සේරුව පිළිබඳ දැනුම හා අදහස් රටවල් අතර ප්‍රවර්ධනය කිරීම සහ හුවමාරු කර ගැනීම පිහිටුවන ලදි. මෙම සමුළුව තක්සේරුකරණය හා සම්බන්ධ ක්‍රමවේදයන්, සියලුම ක්‍රියාකාරකම් හා පාලනයන් උසස්ම ප්‍රමිතියෙන් යුතුව ලබා දීම සඳහා දායකත්වය ලබා දේ.**

**තක්සේරු කිරීමේ සියලුම ක්‍රමවේදයන් පිළිබඳව තක්සේරු වෘත්තිකයන් අතර තොරතුරු හා නව සොයාගැනීම් බෙදාගැනීමේ සම්ප්‍රදාය දිගින් දිගටම පවත්වාගෙන යයි. මෙම සම්මන්ත්‍රණයට පහසුකම් සැලසීමට හැකිවීම සම්බන්ධයෙන් , රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව ආඩම්බර වන අතර එය තත්‍ය දේපල (**Real State**) සම්බන්ධ සියලුම වෘත්තිකයන්ට අදාල අංග සම්බන්ධයෙන් ජාත්‍යන්තර වෘත්තිකයන් සමඟ ජාල ගත වීමට අනගි අවස්ථාවක් වනු ඇත.**



# II කොටස - කාර්යසාධන

## වෘත්තීය නිපුණතා ප්‍රවර්ධනය

## නිපුණතා සංවර්ධන කේන්ද්‍රය

දැනුම, ආකල්ප, හා කාර්යක්ෂමතාවය තේමා කරගනිමින් සහ තිර ජීවන අධ්‍යාපනය තුලින්(Life Long Learning) සේවක අභිමානය යන මූලධර්මයටත් අභිප්‍රේරණය, කාර්යසාධනය ඇගයීම සහ කුසලතා සංවර්ධනය තුලින් සේවක කාර්යක්ෂමතාව හා කැපවීම යන මූලධර්ම ද සැලකිල්ලට ගනිමින් 2006 වසරේදී නිපුණතා සංවර්ධන කේන්ද්‍රය ස්ථාපනය කරන ලදී.

දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයේ සිට සහයක ශ්‍රේණිවල කාර්යමණ්ඩලය දක්වා විහිදී යන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීම තුලින් වෘත්තීය විශිෂ්ඨත්වය ළඟාකර ගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන නිපුණතා සංවර්ධන කේන්ද්‍රය විසින් පුහුණු වැඩසටහන් සංවිධානය හා මෙහෙයවීම සිදුකරයි.

නිපුණතා සංවර්ධන කේක්ද්‍රය විසින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන් ප්‍රධාන අංශ දෙකක් යටතේ පහත පරිදි වර්ගීකරණය කළ හැකි ය.

- අභ්‍යන්තර පුහුණු වැඩසටහන්
- බාහිර පුහුණු වැඩසටහන්

මෙම වැඩසටහන් ඒවා අයත් විවිධ පරාසයන් අනුව තවදුරටත් වර්ගීකරණය කර ඇති අතර පහත පරිදි වේ.

- අභ්‍යන්තර පුහුණු වැඩසටහන්(අභ්‍යන්තර වෘත්තීය නිලධාරීන් සහ කළමනාකරණ සේවාවන් සඳහා)

අ.කාර්යස්ථ පුහුණු වැඩසටහන්

ආ.විෂය කේන්ද්‍රකොට ගත් පුහුණු වැඩසටහන් හා වැඩමුළු

ඉ.විභාග ඉලක්ක කොටගත් පුහුණු සැසි සහ වැඩමුළු

ඊ.දැනුම හුවමාරු කර ගැනීමේ වැඩමුළු

- බාහිර පුහුණු වැඩසටහන්

    අ. ග්‍රාම සේවා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්

    ආ. පළාත් ආදායම් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් හා වැඩමුළු

    ඉ. දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ උපාධි අපේක්ෂකයින් සඳහා වෘත්තීය අනුබද්ධ වැඩසටහන්

    ඊ. අත්කර ගැනීමේ නිලධාරීන් සඳහා වන වැඩසටහන් හා වැඩමුළු

    උ. අවශ්‍යතා අනුව විශේෂයෙන්ම සැකසුණු පුහුණු වැඩසටහන්

## <u>පුහුණු වැඩසටහන් හා පුහුණු වැඩමුළු සඳහා අනුග්‍රහය 2015</u>

### I. වෙනත් ආයතනවල අවශ්‍යතා අනුව විශේෂයෙන් සැකසුන පුහුණු වැඩසටහන්

<u>විද්‍යාවේදී දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා තෙවන වසර උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන</u>

මූලික ක්ෂේත්‍ර පරීක්ෂණයේ සිට තක්සේරු වාර්තාව පිළියෙළ කිරීම දක්වා වන න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික ක්‍රියාවලිය ආවරණය වන පරිදි දින 10 ක කාලයක් තුළ පැවැති පුහුණු වැඩසටහනක් උපාධි අපේක්ෂකයින් 65 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

### II.අභ්‍යන්තර නිලධාරීන් සඳහා අභ්‍යන්තර පුහුණු වැඩසටහන්

<u>දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන</u>

දිස්ත්‍රික් තක්සේරුකරුවන් 65 දෙනෙකු කේන්ද්‍ර කර ගනිමින් ඉඩම් අත්කරගැනීමේ තක්සේරුකරණ හා නීතිමය පසුබිම පිළිබඳ දැනුම බෙදාදීමේ එක්දින වැඩසටහනක් පවත්වන ලදී.

<u>සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා පුහුණු වැඩසටහන</u>

දැව තක්සේරුකරණයේ න්‍යාත්මක අංශයන් ආවරණය වන පරිදි සහකාර දිස්ත්‍රික් තක්සේරුවන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහනකි.

<u>දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන</u>

දිස්ත්‍රික් තක්සේරුකරුවන් කේන්ද්‍ර කර ගනිමින්, තක්සේරු ඒකක කළමනාකරණය, සාමාන්‍ය තක්සේරු සහ විශේෂිත දේපල තක්සේරුකරණය ඉඩම් අත්කරගැනීමේ සමාලෝචන මණ්ඩලයට අදාළ අභියාචනා යන අංශයන්හි දැනුම පුළුල් කිරීමේ අරමුණින් එක් දින වැඩසටහනක් පවත්වන ලදී.

විධායක ශ්‍රේණියේ තක්සේරු නිලධාරීන් වෙනුවෙන් පැවැත්වුන පුහුණු වැඩසටහන

විධායක ශ්‍රේණියේ තක්සේරු කරුවන් කේන්ද්‍රකර ගනිමින් නායකත්ව පුහුණු තේමාව යටතේ හයිබ්‍රැන්ඩ් ටීම් ආයතනය මගින් පවත්වන ලද පුහුණු වැඩමුළුව සඳහා නිලධාරීන් සහභාගි කරවන ලදී.

විශ්‍රාම වැටුප් සඳහා දායකත්වය ගණනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන

විශ්‍රාම වැටුප් සඳහා දායකත්වය ගණනය කිරීම පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පවත්වන ලද එක් දින පුහුණු වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරීන් දෙදෙනා සහභාගි කරවන ලදී.

ප්‍රධාන ලිපිකරුවන් සඳහා පුහුණු වැඩසටහන

රාජ්‍ය කළමණාකරණ සහකාර නිලධාරීන්ගේ දෙපාර්තමේන්තු සහ දෙපාර්තමේන්තු චක්‍රලේඛ පිළිබඳ දැනුම වර්ධනය කිරීමට එක් දින පුහුණු වැඩසටහනක් එම සේවයේ නිලධාරීන් 25 දෙනෙකුට ලබා දෙන ලදී.

විශේෂ පුස්තකාල කළමනාකරණ පුහුණු වැඩසටහන

විශේෂ පුස්තකාල කළමණාකරණ එක්දින පුහුණු වැඩසටහන සඳහා පර්යේෂණ හා සංවර්ධන අංශයට අනුයුක්ත සහකාර දිස්ත්‍රික් තකසේරු නිලධාරියෙක් යොමු කරන ලදී.

පොත් තැබීම පිළිබඳ පුහුණු වැඩසටහන

පොත් තැබීම පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා පවත්වන ලද මෙම එක් දින පුහුණු වැඩසටහන සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් දෙදෙනෙක් සහභාගි කරවන ලදි.

දමිළ භාෂා පුහුණු ප්‍රවීණත්වය පිළිබඳ පුහුණු වැඩසටහන

සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන්, සංවර්ධන නිලධාරීන් සහ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයෙන් නිලධාරීන් දෙදෙනා බැගින් නිලධාරීන් 06 දෙනෙකු දමිළ භාෂා ප්‍රවීණත්වය පිළිබඳ ව පුහුණු වැඩසටහනට සහභාගි කරවන ලදී.

සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන

නවක සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් පුහුණු කිරීමේ අරමුණින් ආයතනික ආචාරධර්ම, පරිපාලනමය වගකීම්, දත්ත කළමනාකරණය, සාමාන්‍ය තක්සේරු සහ වරිපනම් තක්සේරුකරණය යන විෂයයන් කෙරෙහි න්‍යායාත්මක දැනුම වර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

## III.විභාග ඉලක්කගත පුහුණු වැඩසටහන්

සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය ඉලක්ක කොටගත් පුහුණු වැඩසටහන

තක්සේරු සේවයේ IIශ්‍රේණිය IIපන්තිය සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් 10 ක් නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙර සූදානම් කිරීමක් වශයෙන් තෙදිනක් පුරා තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම, වරිපනම් තක්සේරු, දෙපාර්තමේන්තු පරිපාලනය හා මූල්‍ය, දෙපාර්තමේන්තු ව්‍යුහය, ප්‍රාග්ධන තක්සේරු හා විශේෂ දේපලක් සඳහා සවිස්තරාත්මක තක්සේරු වාර්තා පිළියෙල කිරීම, ව්‍යවහාරික තක්සේරුකරණය, වරිපනම් තක්සේරු විරෝධතා හා ඉඩම් අත්කරගැනීමේ සමාලෝචන මණ්ඩලයට අදාළ අභියාචනා යන විෂයයන් ආවරණය කෙරෙමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක විය.

## IV.අභ්‍යන්තර නිලධාරීන් සඳහා බාහිර වැඩසටහන්

දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා පශ්චාත් උපාධි වැඩසටහන

එක්සත් රාජධානියේ රෙඩින් විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන ඉහත පාඨමාලාව සඳහා එක් දිස්ත්‍රික් තක්සේරුකරුවකු හා සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් 03 දෙනෙකු සහභාගි කරවන ලදි.

විශේෂ දේපල තක්සේරුකරණය පිළිබඳ ජාත්‍යන්තර පාඨමාලාව
මැලේසියාවේ පවත්වන ලද ඉහත පාඨමාලාව සඳහා එක් සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවකු සහභාගි කරවන ලදි.

දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා පශ්චාත් උපාධි වැඩසටහන

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් පවත්වන මෙම පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් තක්සේරුකරුවන් සහ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් 8 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන ලබා දෙන ලදී.

මානව සම්පත් කලමනාකරණ පිළිබඳ ඩිප්ලෝමාව
ඉහත පාඨමාලාව සඳහා නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරුසහභාගි කරවන ලදි.

ගෙවල්කුලී මණ්ඩල පිළිබඳ පුහුණු වැඩසටහන
ඉහත වැඩසටහන සඳහා දිස්ත්‍රික් තක්සේරුකරුවන් 14 දෙනෙක් සහභාගි විය.

## තාක්ෂණික ප්‍රවර්ධනය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, නූතන ප්‍රවණතා සමඟ යමින් විද්‍යුත් රාජ්‍ය ප්‍රතිපත්තියේ අරමුණ සපුරාලීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවාවන් විශ්ව සම්මත හා වෘත්තීය තත්වය ආරක්ෂා වන පරිදි කටයුතු කරන ලදී.

## <u>තත් ප්‍රදේශ පරිගණක ජාල පවත්වාගෙන යාම</u>

දෙපාර්තමේන්තු IT කාර්යමණ්ඩලය විසින් සියලුම පළාත් කාර්යාලවලට අයත් තත් ප්‍රදේශ පරිගණක ජාලයන් නොකඩවා පරිපාලනය සහ උපදේශනයන් සපයමින් මෙහෙයවීම සහ පාලනය සිදු කරන ලදී.

## <u>පරිගණකගත පුළුල් තක්සේරු ක්‍රමවේදය</u>

තක්සේරු දෙපාර්තමේන්තුවටම ආවේණික සම්මත ආකාරයට නිර්මාණය කරන ලද යෝජිත ශ්‍රී ලංකා තක්සේරු ක්‍රමය සඳහා කාර්මික පිරිවිතර සහිතව සියලු මූලික කටයුතු සඳහා අවශ්‍ය ලේඛන පරිගණකගත කර ප්‍රසම්පාදන ක්‍රියාවලියට සුදුසු පරිදි නිම කළ අතර, දේශීය හා විදේශීය වශයෙන් ප්‍රසිද්ධ කර සියලුම පරිපාලන හා ලේඛන කටයුතු පිළියෙල කොට තක්සේරු ක්‍රමය පිළිබඳ තාක්ෂණික ඇගයීමක් කර මිල ගණන් කැඳවීමට කටයුතු කළ නමුත්, මූල්‍යමය ප්‍රතිපාදන සැලසීමේ ගැටළු හේතුවෙන් එහි ඉදිරි කටයුතු නවතා දැමීමට සිදු වුව ද ලිපිගොනු කළමනාකරණය පිළිබඳ ව නිර්මාණය කරන ලද පරිගණකගත ක්‍රමවේදය මූලික අදියරෙහි පවතී.

## කාර්යසාධන මිණුම්දඬු සහ වාර්තාකරණය

### 1) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ තක්සේරු

**2015 වසරේදී දෙපාර්තමේන්තුව විසින් 1950 අංක 9 දරණ ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ නිලධාරියා විසින් 17 (1) වගන්තිය ප්‍රකාර කළ යුතු වන්දි ප්‍රදානයන් උදෙසා ඒකක 15,639 ක තක්සේරු වාර්තා නිම කර ඇති අතර, එම පනතේ 38 (අ) විධානය මත කඩිනම් අත්කර ගැනීම් 8092 ක් උදෙසා තත්ත්ව වාර්තා පිළියෙළ කර ඇත.**

### 2) යෝජිත අත්කර ගැනීම් උදෙසා දේපල ඇස්තමේන්තු කිරීම

**ඉඩම් අත්කර ගැනීමේ කාර්යය වෙනුවෙන් මුදල් වෙන්කර ගැනීම සඳහා 2015 වසර තුළ දේපල 648 ක් ඇස්තමේන්තු කර ඇත.**

**3) රජයේ හා රාජ්‍ය ආයතන සතු ඉඩම් වල ප්‍රග්ධන වටිනාකම් තක්සේරු සඳහා තක්සේරු වාර්තා 33,222ක් පිළියෙළ කර ඇත.**

### 4) අල්ලස් පනත යටතේ තක්සේරු කිරීම

**2015 වසර තුළ අල්ලස් පනත යටතේ අල්ලස් කොමසාරිස් වෙත තක්සේරු වාර්තා 10 ක් සපයා ඇත.**

### 5) මුද්දර බදු සඳහා තක්සේරු

**දේපළ 165 ක් සඳහාවූ තක්සේරු කටයුතු නිම කර ඇත.**

### 6) රජය සතු දේපළ සඳහා මාසික කුළී හා වෙනත් බදු කුළීතීරණය කිරීම

**ආයතන සංග්‍රහයේ xix වන පරිච්ඡේදයේ 5:1 සහ 7:1 යටතේ නියම කළ යුතු ආර්ථික කුළී හා දණ්ඩන කුළී අයකිරීම් උදෙසා කුළී තක්සේරු වාර්තා 4094 ක් වාර්තා කොට ඇත.**

### 7) කුළී තක්සේරු කිරීම


**2015 වසර තුළ විවිධ රාජ්‍ය ආයතනවල පරිහරණය සඳහා දේපළ 7619 ක් සඳහා කුළී වාර්තා පිළියෙළ කර ඇත.**

### 8) ගෙවල් කුළී මණ්ඩල රැස්වීම්

**සමාලෝචිත වසර තුළ දෙපාර්තමේන්තු නිලධාරීන් ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් දිවයින පුරා ගෙවල් කුළී මණ්ඩල රැස්වීම් වාර 421 ක් සඳහා සහභාගි වී ඇත.**

## නිම කළ සාමාන්‍ය තක්සේරු වාර්තා

| තක්සේරු වර්ගය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 අපේක්ෂිත |
|---|---|---|---|---|---|---|
| තත්ත්ව වාර්තා | 7,865 | 6,693 | 13,818 | 22,877 | 8,092 | 32,000 |
| ඉඩම් අත්කර ගැනීම | 8,895 | 8,366 | 9,320 | 16,476 | 15,639 | 20,000 |
| ඉඩම් ඇස්තමේන්තු | 1,171 | 1,628 | 1,423 | 1,243 | 648 | 1,000 |
| ඉඩම් විවිධ | 28,567 | 29,820 | 58,563 | 48,174 | 33,222 | 40,000 |
| අල්ලස් කොමසාරිස් සඳහා | 2 | 11 | 17 | 3 | 10 | - |
| මුද්දර ගාස්තු | 249 | 595 | 472 | 341 | 165 | 200 |
| කුළී පුද්ගලික | 4,872 | 5,686 | 6,851 | 6,067 | 7,619 | 7,000 |
| කුළී රජය | 4,577 | 5,925 | 5,159 | 4,521 | 4,094 | 4,000 |





* මුද්දර බදු සහ අල්ලස් කොමසාරිස් වෙත වාර්තා පෙන්නුම් කර නොමැත.

**සාමාන්‍ය තක්සේරු**

**2015 ඉලක්ක ගත<2015 නිමකළ>2016ඉලක්කගත**

| | 2015 ඉලක්ක ගත | 2015 නිමකළ | 2016 අපේක්ෂිත |
|---|---|---|---|
| තත්ත්ව වාර්තා | 30,650 | 8,092 | 32,000 |
| ඉඩම් අත්කර ගැනීම් | 19,500 | 15,639 | 20,000 |
| ඉඩම් ඇස්තමේන්තු | 1,100 | 648 | 1,000 |
| ඉඩම් විවිධ | 63,900 | 33,222 | 40,000 |
| පුද්ගලික කුලී තක්සේරු | 6,600 | 7,619 | 7,000 |
| රජයේ කුලී තක්සේරු | 3,800 | 4,094 | 4,000 |

**නිම කළ සාමාන්‍ය තක්සේරු වාර්තා – වසරින් වසර හා ඉලක්කගත**




## 8. වරිපනම් තක්සේරු සාරාංශය

පළාත් පාලන ආයතන, එනම් මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සඳහා වරිපනම් බදු අය කිරීම සඳහා 2015 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් නිම කළ වරිපනම් තක්සේරු හා පශ්චාත් වරිපනම් තක්සේරු සැළකිය යුතු ප්‍රමාණයක් වූ අතර එහි සාරාංශයක් පහත දැක්වේ.


වරිපනම් තක්සේරු
2011 - 2015 සහ 2016 අපේක්ෂිත

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 අපේක්ෂිත |
|---|---|---|---|---|---|---|
| මූලික සමීක්ෂණ | 326,933 | 279,357 | 243,390 | 184,675 | 119,539 | 300,000 |
| අවසන් සමීක්ෂණ | 308,480 | 243,726 | 203,702 | 180,548 | 150,455 | 300,000 |




## වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන
## 2015 ඉලක්කගත <2015 නිමකළ > 2016 ඉලක්කගත

| | 2015 ඉලක්කගත | 2015 නිමකළ | 2016 අපේක්ෂිත |
|---|---|---|---|
| මූලික සමීක්ෂණ | 290,000 | 119,539 | 300,000 |
| අවසන් පරීක්ෂණ | 290,000 | 150,455 | 300,000 |



### පශ්චාත් වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන කටයුතු


| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 අපේක්ෂිත |
|---|---|---|---|---|---|---|
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන | 33,068 | 32,596 | 31,133 | 26,290 | 25,919 | 25,000 |
| වරිපනම් ප්‍රතිශෝධන ගොඩනැගිලි | 3,171 | 2,152 | 1,676 | 2,227 | 1,499 | 2,500 |
| වරිපනම් අභියාචනා | 4,993 | 9,393 | 10,665 | 8,451 | 5,149 | 3,000 |



**වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන**

**2015 ඉලක්කගත < 2015 නිමකළ > 2016 ඉලක්කගත**

| | 2015 ඉලක්කගත | 2015 නිමකළ | 2016 අපේක්ෂිත |
|---|---|---|---|
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන ඉඩම් | 24,000 | 25,919 | 25,000 |
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන ගොඩනැගිලි | 2,100 | 1,499 | 2,500 |
| වරිපනම් තක්සේරු අභියාචනා | 8,600 | 5,149 | 3,000 |




## 10. රාජ්‍ය වත්කම් තක්සේරු කිරීම.

රජය සතුව පවතින සියළුම ස්ථාවර වත්කම් වල වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය තක්සේරු දෙපාර්තමේන්තුව මත පවරන ලද අතර ඒ සඳහාම 2012 වර්ෂයදී පිහිටුවනු ලැබූ රාජ්‍ය වත්කම් තක්සේරු කිරීමේ අංශයෙහි සම්බන්ධීකරණය යටතේ කඩිනම් ව්‍යාපෘතියක් ලෙස මෙම කාර්යය ඉටුකරන ලදී . 2015 වර්ෂය දෙසැම්බර් මාසය වන විට අමාත්‍යාංශ 55 ක් හා අමාත්‍යාංශක් යටතට නොගැනෙන මැතිවරණ දෙපාර්තමේන්තුව සහ විශේෂ වැය ඒකක යටතේ අග්‍රාමාත්‍ය කාර්යාලය පමණක් තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර තිබූ අතර ඒ සියල්ල අනුව ,97% වූ සම්පූර්ණ කරන ලද වාර්ථා මේවන විටත් අදාල අමාත්‍යාංශ වෙත භාර දී ඇත.

| වර්ෂය | සම්පූර්ණ කරන ලද වාර්තා % ලෙස | ඒකක සංඛ්‍යාව |
|---|---|---|
| 2013 | 21% | 1167 |
| 2014 | 47% | 2631 |
| 2015 | 29% | 2345 |


රාජ්‍ය වත්කම් තක්සේරු කිරීමේ ප්‍රගතිය




## 11. ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ ආයතන කටයුතු ලුහුඬින්

දෙපාර්තමේන්තුවේ නීති අංශයේ ප්‍රධාන කාර්ය වන්නේ 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ස්ථාපිත ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත, දේපළ අත් කර ගැනීම යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් නොවූවන් විසින් ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳ ආයතන කටයුතු හා ඒ සඳහා රජය වෙනුවෙන් සාක්ෂි මෙහෙයවීම වන අතර, ඉඩම් අත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ අභියාචනා කළමනාකරණ කටයුතු පහත පරිදි වේ.

| අභියාචනා කළමනාකරණ ගිණුම<br>ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016<br>අපේක්ෂිත |
| වසර මුල ඉතිරි | 749 | 1,161 | 2,088 | 978 | 2,216 | 2,264 |
| වසර තුළ ලද සංඛ්‍යාව | 401 | 325 | 245 | 429 | 558 | 517 |




| අභියාචනා කළමනාකරණ ගිණුම<br>ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 අපේක්ෂිත |
| අසා නිමකළ | 221 | 297 | 279 | 256 | 282 | 292 |
| ඇසීම සඳහා සූදනම් කළ | 465 | 435 | 1223 | 1234 | 926 | 1373 |
| ඇසීම සඳහා සූදනම් කළ - අසම්පූර්ණ | 693 | 754 | 831 | 173 | 1566 | 1153 |



## ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය විසින් නිම කරන ලද අභියාචනා සාරාංශය


| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 අපේක්ෂිත |
|---|---|---|---|---|---|---|
| මූලික විභාගයෙන් පසුව අවසන් කළ | 30 | 143 | 61 | 18 | 19 | 10 |
| ඉල්ලා ඉවත්කරගත් අභියාචනා | 69 | 106 | 52 | 52 | 89 | 70 |
| සමථයට පත් කළ | 67 | 42 | 81 | 114 | 176 | 212 |
| ප්‍රතික්ෂේපිත අභියාචනා | 55 | 96 | 85 | 115 | 282 | 269 |

නිම කරන ලද අභියාචනා ගිණුම - ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය



# III කොටස- මූල්‍යමය සාධනය සහ විශ්ලේෂණය

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| සැබෑ ආදායම | රු.22,981,498 | රු.32,585,000 | රු.59,347,000 | රු.101,280,582 | රු.53,047,155.68 |
| කල්පිත ආදායම | .25,000,000 | රු.30,000,000 | රු.30,000,000 | රු.30,000,000 | රු.54,000,000.00 |



# IVකොටස - අනුමත මානව සම්පත් සහ ශ්‍රම ශක්තිය

## සේවක පිරිස් ගිණුම

මෙය දෙපාර්තමේන්තුවේ එක් එක් තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ **2015-12-31** දිනට සේවයේ නියුතු ව සිටි සේවක සංඛ්‍යාව පිළිබඳ ව වන සාරාංශගත ගිණුමකි.

| තනතුර | අනුමත | සිටින | පුරප්පාඩු | වෙනත් |
|---|---|---|---|---|
| ප්‍රධාන තක්සේරුකරු | 01 | 01 | - | |
| අතිරේක ප්‍රධාන තක්සේරුකරු | 01 | 01 | - | |
| නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු - පන්තිය | 04 | 03 | 01 | |
| අධ්‍යක්ෂ (පරිපාලන) ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | - | 01 | |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - | |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 | 01 | - | |
| පළාත් තක්සේරුකරු - පන්තිය - ශ්‍රේණිය | 15 | 02 | 13 | |
| දිස්ත්‍රික් තක්සේරුකරු - පන්තිය - ශ්‍රේණිය | 60 | 42 | 18 | |
| නීති නිලධාරී | 02 | 01 | 01 | |
| පරිපාලන නිලධාරී | 02 | 02 | - | |
| තොරතුරු හා සන්නිවේදන නිලධාරී- (Zපන්තිය - II/I) | 02 | 0 | 2 | |
| භාෂා පරිවර්තක සිංහල - දෙමළ | 1 | 0 | 1 | |
| සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු | 360 | 340 | 20 | |
| අයවැය සහකාර | 01 | 01 | - | |
| සංවර්ධන නිලධාරී | 42 | 24 | 18 | |
| රාජ්‍ය කළමනාකරණ සහකර සේවය | 103 | 100 | 3 | |
| තොරතුරු හා සන්නිවේදන නිලධාරී(3පන්තිය - II/I) | 03 | 0 | 2 | |
| රියදුරු | 18 | 17 | 01 | |
| කාර්යාල කාර්ය සහායක -(III/II/I) | 74 | 75 | -1 | |
| සංචාරක බංගලා භාරකරු | 02 | 02 | - | |
| එකතුව | **694** | **613** | **81** | |

## Vකොටස - දේපළ වෙළඳපළ විග්‍රහය

### “දේපළ වෙළඳපළ විග්‍රහය කෙටියෙන් ” ශ්‍රී ලංකා

ශ්‍රී ලංකා රජයේ ආර්ථික හා සාමාජීය ප්‍රතිපත්තිය යටතේ සිදු කරන ලද අග නගරය හා අවට ප්‍රදේශ සංවර්ධනය හා නගර අලංකාරය ආශ්‍රිත ක්‍රියාකාරකම් මගින් එම ප්‍රදේශ වල සිදුවූ ආර්ථික හා සාමාජීය සංවර්ධනය, විදේශීය ආයෝජනය මෙම ප්‍රදේශවල විවිධ සංවර්ධන කටයුතුවල නියැලීමට පිටුවහලත් වන ලදී. මෙම කටයුතු මගින් කොළඹ නගරය ශ්‍රී ලංකාවේ වෙළඳ නගරය මෙන්ම එය දේශීය, විදේශීය ජනතාව කොළඹ නගරය දෙසට ඇද-බැඳ තබා ගැනීමේ හැකියාව වර්ධනය කරන්නක්ද විය.

තවද, ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියේ අවශ්‍යතාවන් සපුරන පරිදි අවශ්‍යතා අතර සම්බන්ධතාවයෙන් බැඳෙන සේ සකසන ලද ආයතනික බැඳීම් ඇති කිරීම විශේෂ ලෙස දැක්විය හැකි ය. දේපල වෙළඳපලේ පවතින වෙනස්වීම් පිළිබඳ තොරතුරු ක්ෂණිකව මහජනතා හෝ ආයෝජකයින් වෙත ගලා යාම සිදු නොවන බැවින් එහි ඇතිවන උච්ඡාවචන වලින් නිවරැදි ලෙස ලාභ ලබා ගැනීමේ හැකියාව සීමා වී ඇති බැවින් වඩා ඵලදායි දේපළ වෙළඳපලක් ඇති කිරීම සඳහා ක්ෂණිකව යාවත්කාලීන වන තොරතුරු පද්ධතියක් පවතින්නේනම් එය දේශීය වෙළඳපොල ආර්ථිකයට සුබදායක වනු ඇත.

ඊ.දයාසේන
ප්‍රධාන තක්සේරුකරු
තක්සේරු දෙපාර්තමේන්තුව